(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 12(3).]

# පාර්ලිමේන්තුවේ අංක 12 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2014 සැප්තැම්බර් මස 10 වැනි බදාදා**

---

## 2014 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2732/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගල්ගමුව මහ වැවෙන් ජලය සපයනු ලබන කුඹුරු අක්කර සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම වැවෙන් යැපෙන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අක්කර 20ක් පමණ වන ගල්ගමුව වැවෙහි අක්කර 18 ක පමණ ප්‍රදේශයක් මේ වන විට වැලි හා පස්වලින් පිරී ඇති බවත්;

(ii) කන්න දෙකම වගා කිරීමට තරම් ප්‍රමාණවත් ජලය රැස්කළ හැකිව තිබූ මෙම වැව යටතේ මේ වන විට එක් කන්නයක්වත් වගා කළ නොහැකි තත්වයක් උද්ගත වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් වැවෙහි ජලය ප්‍රයෝජනයට ගෙන ගොවිතැන් කටයුතු කරන ජනතාව වෙනුවෙන් පස් හා රොන් මඩ ඉවත්කර එම වැව ප්‍රතිසංස්කරණය කර දෙන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4164/'13

ගරු පී. හැරිසන් මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාණ්ඩවල නම් කවරේද;

(ii) එම එක් එක් කාණ්ඩයට අයත් වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාණ්ඩ අතර සිටින සර්වාංග විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට 2013 දක්වා කාල සීමාව තුළ ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් බලපත්‍ර ලබාදී ඇති සමස්ත සම්බාහන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, ඒවායේ ලිපිනයන් සමග දිස්ත්‍රික්ක මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට අවසර ලබාදී ඇති වෛද්‍යවරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) ආයුර්වේද දෙපාර්තමේන්තුවට අමතරව වෙනත් ආයතන මගින් සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබාදී තිබේ නම්, එම ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා තිබිය යුතු අවම වෘත්තීය සුදුසුකම් කවරේද;

(ii) එවැනි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන ස්ථානයක තිබිය යුතු තත්ත්වයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

දහම් පාසල් ගුරු අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2014 සැප්තැම්බර් මස 24 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3314/'12

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008, 2009 සහ 2013 වර්ෂවලදී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(ii) පසුගිය වර්ෂ පහ තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණි රටවල් සහ ඔවුන් දිවයිනෙහි රැඳී සිටි සාමාන්‍ය දින ගණන කවරේද;

(iii) සංචාරක ව්‍යාපාරය තුළින් ඉපයූ ආදායම සහ සංචාරකයන් විසින් වියදම් කළ සාමාන්‍ය පිරිවැය 2008, 2009 සහ 2013 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ පහ තුළ ඍජුව සහ වක්‍රව සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ වූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?

(ඇ) (i) රට තුළ තිබෙන හෝටල් කාමර සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත කාමරවලින් සමන්විත වන හෝටල් තරු වර්ගීකරණයට අනුව කවරේද;

යන්න එතුමා තවදුරටත් 2010, 2011 සහ 2012 යන වර්ෂවලට අදාළව සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 සැප්තැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4088/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා පිහිටි තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති බව දන්නේද;

(ii) ඒ සඳහා ගිවිසුම ඇති කර ගන්නා ලද ආයතනයේ නම කවරේද;

(iii) එම ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලැබුවේද;

(iv) අදාළ ගිවිසුමෙහි පිටපතක් මෙම සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නේද;

(v) එම ගිවිසුම අත්සන් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ කාල සීමාව කොපමණද;

(iii) ජාලගත කරන ලද තැපැල් කාර්යාල සංඛ්‍යාව අදියරෙන් අදියර, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ඔක්තෝබර් මස 07 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2665/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි පන්සල්, කෝවිල්, පල්ලි හා මුස්ලිම් දේවස්ථාන ඇතුළු ආගමික සිද්ධස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සකස් කර ඇති රජයේ ආධාර වැඩසටහන් කවරේද;

(ii) එම ආධාර වැඩසටහන්වලට අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3245/'12

ගරු රවී කරුණානායක මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) තැපැල් දෙපාර්තමේන්තුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3720/'13

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ පහ තුළ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ආනයනය කරන ලද දුම්රිය එන්ජින් හා මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා මිලදී ගනු ලැබූ රට හෝ රටවල් කවරේද;

(iii) මිලදී ගැනීමේදී අනුගමනය කරන ලද පටිපාටිය කවරේද;

(iv) ඒවා මිලදී ගැනීම සඳහා මුදල් සම්පාදනය කරගත් ආකාරය කවරේද;

(v) මුදල් සම්පාදනය වෙනුවෙන් දේශීය හෝ විදේශීය ණය ලබාගෙන තිබේද;

(vi) එසේ නම්, එම ණය ප්‍රමාණයන්, පොලී අනුපාතිකයන් සහ අදාළ කොන්දේසි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආනයනය කරන ලද ඉහත සඳහන් එන්ජින් හා මැදිරිවල අවශ්‍ය තාක්ෂණය නොමැති බව හෙළිවී තිබේද;

(ii) ඒ සඳහා බලපා ඇති හේතු කවරේද;

(iii) එම තාක්ෂණික දෝෂ සහිත දුම්රිය මැදිරි හා එන්ජින් මිලදී ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා තිබේද;

(iv) එසේ නම්, එම පරීක්ෂණය අනුව ඉහත මිලදී ගැනීම් සඳහා වගකිව යුතු අය කවුරුන්ද;

(v) ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3830/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හක්මණ - මාතර මාර්ගය පුළුල් කර කාපට් කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එම මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) ඒ සඳහා අරමුදල් සපයා ගන්නා මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) මාතර - හක්මණ මාර්ගය, ගොඩගම - බෙලිඅත්ත අධිවේගී පිවිසුම් මාර්ගය යැයි පවසමින් පුළුල් කරන බව දන්නේද;

(iii) එම මාර්ගය පුළුල් කර සංවර්ධනය කරන්නේ නම්, මීට වඩා වැඩි ප්‍රදේශයක් ආවරණය වන ගොඩගම අකුරැස්ස මාර්ගයද සංවර්ධනය නොකිරීමට හේතු කවරේද;

(iv) මීට වර්ෂ 7-8 කට පෙරද කාපට් කරන ලද එම මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරියේ ඉහළ නිලධාරීන්ගේ වැරදි වාර්තා පදනම් කරගෙන නැවතත් පුළුල් කිරීමට කටයුතු කරන බව දන්නේද;

(v) කාපට් කරන ලද මාර්ගයක් නැවත කාපට් කිරීමට කටයුතු කිරීම මුදල් නාස්ති කිරීමක් නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4176/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පාලනය වන කොළොන්නාව ප්‍රධාන සේවා ස්ථාන උපකරණ වැඩපොළෙහි අධීක්ෂණ කටයුතු සිදුවන්නේ කුමන නිලධාරියෙකු යටතේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2005 වර්ෂයේ සිට 2013 වර්ෂයේ ජූනි මාසය දක්වා කාල සීමාව තුළ ඉහත වැඩපොළෙහි,

(i) පොම්ප මිලදී ගැනීමට, අමතර කොටස් මිලදී ගැනීමට සහ ඉන්ධනහල් අලුත්වැඩියාවට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අමතර කොටස් විකිණීම තුළින් උපයන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2013 වර්ෂයේ ජූනි මාසය අවසන් වන විට එම වැඩපොළෙහි සේවයේ නියුතුව සිටි සේවකයින් සංඛ්‍යාව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4584/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශගත ශ්‍රමිකයින්ගේ දායක මුදලින් ක්‍රියාත්මක වන අනිවාර්ය රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදී ඇති බවත්;

(ii) ආරම්භයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් ක්‍රියාත්මක කර පසුකාලීනව විදේශ රැකියා ඒජන්සි සමාගමක් වෙත පැවරූ එම රක්ෂණ කටයුතු එකී සමාගම විසින් තැරැව්කාර සමාගමක් මගින් එම්. බී. එස්. එල්. රක්ෂණ සමාගම වෙත පවරා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදේශ රැකියා ඒජන්සි සමාගම විසින් එකී තැරැව්කාර සමාගමේ සේවා ලබාගැනීම ඇරඹූ දිනය කවරේද;

(ii) විදේශගත ශ්‍රමිකයකුගෙන් අය කරන වාරිකයෙන් එම තැරැව්කාර සමාගම වෙත ගෙවනු ලබන ප්‍රතිශතය කවරේද;

(iii) මේ දක්වා එම සමාගම වෙත ගෙවා ඇති මුළු මුදල කොපමණද;

(iv) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් එම රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කළ විටදී තැරැව්කරුවෙකුගේ සේවය ලබාගත්තේද;

(v) තැරැව්කරුවෙකුගේ සේවය ලබා ගැනීමෙන් අත් වූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) තැරැව්කාර සේවා වෙනුවෙන් ගෙවූ ගාස්තු ලබා ගත් තැරැව්කාර සමාගම් නියෝජිතයා කවුරුන්ද;

(ii) එම නියෝජිතයා එකී ගාස්තු ගෙවන ලද මුළු කාල පරිච්ඡේදය මුළුල්ලේම එම සමාගමේ සේවයෙහි නිරතව සිටියේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4591/’13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ජනගහනයෙන් පාසල් හැර ගිය සංඛ්‍යාව කොපමණද;

(ii) එම දරුවන් පාසැල් හැරයාමට හේතු වූ කරුණු සොයා බැලීම සඳහා අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම අධ්‍යයනයට අනුව හඳුනාගෙන ඇති හේතු කවරේද;

(iv) හඳුනාගත් එම හේතු සඳහා පිළියම් යෙදීමට සහ පාසල් හැරයාමේ සංඛ්‍යාව අවම කිරීමට ගෙන යන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සිසුන් පාසල් හැර යාම වැඩි වශයෙන් සිදුවන ප්‍රදේශ කවරේද;

(ii) එම ප්‍රදේශවල පාසල් හැර යාම, පොදු හේතුවලට අමතරව වෙනත් විශේෂ හේතු මත සිදුවන්නේද;

(iii) එසේ නම්, එම හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4656/’13

ගරු සුජීව සේනසිංහ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1994 සිට 2014 දක්වා අවුරුදු 20ක කාලය තුළ රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කර තිබේද;

(ii) එසේ නම්, එම ආයතන කවරේද;

(iii) එම ආයතන මිලට ගත් ආයතන හෝ පාර්ශ්වයන් කවුරුන්ද;

(iv) රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය රජයේ ප්‍රතිපත්තියට පටහැනි නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4673/'13

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් තනතුර දැරීම සඳහා තිබිය යුතු සුදුසුකම් කවරේද;

(ii) එම තනතුරේ සේවය කළ යුතු කාල සීමාවන් තිබේද;

(iii) එම තනතුර සඳහා ගෙවනු ලබන වැටුප කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "වකුගඩු රෝගයට හේතු විය හැක" යන පදනම මත වර්තමාන පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉදිරි වර්ෂ දෙකක කාල සීමාව සඳහා ආනයනය අත්හිටුවා ඇති පළිබෝධ නාශක වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ආනයනය කිරීම නතර කරන ලෙස ලෝක සෞඛ්‍ය සංවිධාන මගින් ද ඉල්ලා ඇති පළිබෝධ නාශක කවරේද;

(iii) ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් රට තුළට ආනයනය නොකරන ලෙස ඉල්ලා ඇති පළිබෝධ නාශක ගෙන්වීම ආරම්භ කරනු ලැබූ වර්ෂය කවරේද;

(iv) දැනට රජය මගින් තහනමට ලක් කර ඇති පළිබෝධ නාශක වෙනත් නම් යටතේ ගෙන්වන බව දන්නේද;

(v) එසේ නම්, එවැනි කටයුතුවල යෙදෙන සමාගම්වලට එරෙහිව ගනු ලබන නීත්‍යානුකූල පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4754/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයින තුළ ඇති පොල් තෙල් කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින එම කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) 2005 වර්ෂයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වූ පොල් කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින පොල් කර්මාන්ත ශාලා සංඛ්‍යාව කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පමණක් පොල් කර්මාන්ත ශාලා 80 ක් පමණ වැසී ගොස් ඇති බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4850/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මූලික අවශ්‍යතා සපුරා ගැනීමට එක් පුද්ගලයෙකුට මසකට දැරීමට සිදුවන අවම වියදම මත පදනම්ව, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සෑම මසකම දිස්ත්‍රික් දරිද්‍රතා රේඛාව ප්‍රසිද්ධ කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොළඹ දිස්ත්‍රික්කය සඳහා පවතින නවතම නිල දරිද්‍රතා රේඛාව කවරේද;

(ii) ඉහත කී දරිද්‍රතා රේඛාව ගණනය කිරීමේදී පදනම් කරගනු ලබන "මූලික අවශ්‍යතා" කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4921/'14

ගරු තිස්ස අත්තනායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 සහ 2014 වර්ෂයන්හි නීති විද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව;

(ii) 2013 සහ 2014 වර්ෂවලදී නීති විද්‍යාලයට ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව;

(iii) 2014 වර්ෂයේ දී එක් එක් දිස්ත්‍රික්කයෙන් නීති විද්‍යාලය සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂය සඳහා නීති විද්‍යාලයට ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව විශාල වශයෙන් අඩු කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4958/'14

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව මගින් පාලනය කරන පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල් වෙතින් 2012 සහ 2013 වර්ෂවල දී ප්‍රතිකාර ලබා ගෙන ඇති බාහිර රෝගීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වයඹ පළාත් සභාව යටතේ පාලනය වන ඉහත අ(i) හි සඳහන් එක් එක් රෝහල සඳහා අනුමත වෛද්‍යවරුන්, හෙදියන්, සෞඛ්‍ය උපස්ථායකයින්, රෝහල් කම්කරුවන් හා අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යා;

(ii) එම රෝහල්වල ඉහත තනතුරුවලට අදාළව මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) ඉහත ආ (ii) හි සඳහන්වන පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5030/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින බුලත් ගොවීන් සංඛ්‍යාව ආසන්න වශයෙන් කොපමණද;

(ii) වැඩි වශයෙන් බුලත් වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(iii) බුලත් අපනයනය කරනු ලබන ප්‍රධාන රටවල් කවරේද;

(iv) බුලත් අපනයනය තුළින් වාර්ෂිකව උපයනු ලබන විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බුලත් වගාකරුවන්ට සහනාධාර ක්‍රමයක් යටතේ පොහොර ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) දේශීය වෙළඳපොළෙහි ඉතා කෙටි කාල පරාසයන් තුළ සිදුවන බුලත් මිල උච්චාවචනය වීම අවම කිරීමට සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දීම පිළිබඳව අධ්‍යයනය කර තිබේද;

(iii) බුලත් වගාව පිළිබඳව පර්යේෂණ කටයුතු සිදු කරනු ලබන්නේද;

(iv) එසේ නම්, එම පර්යේෂණ තුළින් බුලත් වගාවේ උන්නතිය උදෙසා මෑත දී සිදු කර ඇති ප්‍රධානතම සොයා ගැනීම් හෝ නිර්දේශයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2734/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැල්සිරිපුර, උස්සාව, ගුරු ඇල අමුණ මගින් වගා කළ හැකි කුඹුරු අක්කර සංඛ්‍යාව කොපමණද;

(ii) එම අමුණ මගින් යැපෙන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මේ වන විට ඉහත සඳහන් ගුරු ඇල අමුණ කැඩී ගොස් ඇති අතර ඒ යටතේ වගා කටයුතු කළ ගොවි පවුල් 500ක් පමණ ජලය නොමැතිව දුෂ්කරතාවයන්ට මුහුණ දී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) ගුරු ඇල අමුණ ප්‍රතිසංස්කරණය කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කරන මුළු මුදල කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරන දිනය කවරේද;

(iv) එම අමුණ ප්‍රතිසංස්කරණය කරන තෙක් දුෂ්කරතාවයන්ට පත්වූ ගොවි පවුල්වලට වන්දි මුදලක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ඔක්තෝබර් මස 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2670/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තය නංවාලීම උදෙසා ක්‍රියාත්මක කර ඇති ජාතික වැඩපිළිවෙළ කවරේද;

(ii) කරදිය ධීවර ප්‍රජාවට ධීවර කාර්මික උපකරණ ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, එම වැඩසටහන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(v) එම මුදල ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට වෙන් කළ මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(vi) වෙන් කරන ලද එම මුදල ප්‍රමාණවත් වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3246/'12

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3713/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවලදී ජනාධිපති අරමුදලට ලැබුණු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් සම්පාදනය කරගත් ආකාරය කවරේද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජනාධිපති අරමුදලින් පසුගිය වර්ෂ දෙක තුළ දී වැය කරනු ලැබූ සමස්ත මුදල;

(ii) එක් එක් ක්ෂේත්‍රය අනුව වැය කළ මුදල;

කොපමණද යන්නත් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ජනාධිපති අරමුදලින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ආධාර ලබා දීම සඳහා පුද්ගලයින් තෝරා ගැනීම සිදුකරන පදනම කවරේද;

(ii) පසුගිය වර්ෂ 03ක කාලය තුළ ප්‍රාදේශීය සභා, පළාත් සභා සහ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ජනාධිපති අරමුදලින් ආධාර ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඔවුන්ගේ නම් සහ එක් එක් තැනැත්තාට ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3961/13

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉන්දියාවේ, පටියාලා පන්ජාබ් විශ්වවිද්‍යාලයේ 2013.02.24 සිට 2013.02.28 දින දක්වා පැවති හයවැනි දකුණු ආසියානු විශ්වවිද්‍යාල සංස්කෘතික උළෙලට සහභාගී වූ, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නියෝජනය කළ කණ්ඩායම දක්ෂතම සහ ප්‍රථම ස්ථානය දිනාගත් කණ්ඩායම ලෙස පත්වූ බවට මෙරට පුවත්පත්වල පළවී තිබූ බවත්;

(ii) එසේ වුවද, එම උළෙලේදී සංස්කෘතික අංග ඉදිරිපත් කිරීම විනා තරග පැවැත්වීමක් සිදු නොකළ බවත්;

(iii) ඉහත උළෙලේදී සහභාගීත්වය සඳහා සහතිකපත්‍රයක් පමණක් ලබාගත් ඉහත කණ්ඩායම ප්‍රථම ස්ථානය ලබාගත් කණ්ඩායම ලෙස හුවා දක්වමින් ඔබතුමා ද ඇතුළු විද්වත් පිරිසක්, කැඳවා විශාල මුදලක් වැයකර ව්‍යාජ ඇගයීමේ උළෙලක් පවත්වන ලද බවත්;

(iv) එම වංචනික ක්‍රියාව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උප කුලපති ජයසේන කෝට්ටගොඩගේ මහතා විසින් තම පුත් ජානක කෝට්ටගොඩගේ මහතා වෙනුවෙන් සිදුකළ බවට එම විශ්වවිද්‍යාලයේ දෘශ්‍යකලා පීඨ ශිෂ්‍ය සංගමයේ ලේකම් විසින් චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත වංචනික ක්‍රියාව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා වැරදිකරුවන්ට දඬුවම්දීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4419/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වලව විශේෂ බලප්‍රදේශයට යටත්ව පවතින, ඇඹිලිපිටිය කඩදාසි කම්හලට අයත් අක්කර 500ක පමණ භූමි ප්‍රදේශයේ පවතින;

(i) නිල නිවාස හා අනෙකුත් ගොඩනැගිලි ආදිය මේ වන විට පරිහරණය කරනු ලබන්නේද;

(ii) ඉඩම්වල අනවසරයෙන් පදිංචිවීම් සම්බන්ධව තොරතුරු ලැබී තිබේද;

(iii) ඉඩම්වල ගස් සහ දැව කොටස් කපා ප්‍රවාහනය කිරීම පිළිබඳ තොරතුරු ලැබී තිබේද;

(iv) ඉඩම්, ගොඩනැගිලි සහ අනෙකුත් දේපළ ආරක්ෂා කිරීම වෙනුවෙන් යම්කිසි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4624/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භාවිතයට නුසුදුසු ඉන්ධන ගෙන්වීම සම්බන්ධයෙන් චෝදනාලත් ආයතන දෙකකට නැවත ඉන්ධන ගෙන්වීමට අවසර ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ආයතනවල නම් කවරේද;

(iii) එම ආයතන දෙක තහනම් කරනු ලැබුවේ කුමන පදනමක් මතද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගුවන් යානා සඳහා භාවිතයට ආනයනය කරනු ලැබූ ඉන්ධන, භූමිතෙල් ලෙස භාවිතා කරනු ලබන්නේද;

(ii) ඔක්ටේන් 95 ලෙස ගෙන්වන පෙට්‍රල් ඔක්ටේන් 90 ලෙස අගය බාල කර වෙළඳපොළ වෙත මුදා හරිනු ලැබුවේද;

(iii) එසේ නම්, එසේ කිරීමට සිදු වූ පෙට්‍රල් තොගය සැපයූ චීන සමාගමට යළිත් බොර තෙල් ගෙන්වීමට අවසර ලබා දී තිබීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ආයතන, ඉන්ධන ආනයනය කිරීමේදී අක්‍රමිකතාවන් සිදුකර ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම සමාගමට එරෙහිව මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4636/'13

ගරු පී. හැරිසන් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 අයවැයෙන් ගොවි විශ්‍රාම වැටුප ලබා දීමේ කාලය අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීමට හේතු වූ කරුණු කවරේද;

(ii) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂන ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතින් වයස අවුරුදු 60 දී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සම්මත වුවද, එය අවුරුදු 63 දක්වා දීර්ඝ කිරීම හේතුවෙන් එකී පනත උල්ලංඝණය වීමක් සිදුවන්නේද;

(iii) නොඑසේ නම්, 2011 වර්ෂයේ සිට 2013 නොවැම්බර් මාසය දක්වා වාරික ගෙවා විශ්‍රාම වැටුපට සුදුසුකම් ලැබූ අය වෙනුවෙන් හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගොවි විශ්‍රාම වැටුපේ දායකත්වය වයස අවුරුදු 18 සිට වෙන් වෙන් වශයෙන්; සහ

(ii) ගොවි විශ්‍රාම වැටුප සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ, ගොවිසෙත ලොතරැයියේ හා ගොවි ජනතාවගේ දායකත්වය වෙන් වෙන් වශයෙන්;

එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4733/'14

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014 වර්ෂය සඳහා පාසල් නිල ඇඳුම් සඳහා රෙදි ලබා දිය යුතුව තිබූ ගැහැනු සහ පිරිමි ළමුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එක් එක් දිස්ත්‍රික්කයේ පාසල් නිල ඇඳුම් එනම්, සුදු ගවුම්, සුදු කමිස හා කලිසම්, කුඩා පිරිමි සිසුන් සඳහා නිල් කලිසම් සඳහා අවශ්‍ය රෙදි ප්‍රමාණය කොපමණද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි මිල දී ගත් ආකාරය කවරේද;

(ii) ඊට අදාළව ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iii) එසේ නම්, එක් එක් ටෙන්ඩර් අයදුම්කරුගේ නම, ඉදිරිපත් කළ මිල ගණන් සහ රෙදි වර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉදිරිපත් කළ රෙදි වර්ග නියමිත පිරිවිතරයන්ට අනුකූලදැයි තාක්ෂණික ඇගයුම් කමිටුවක් මගින් පරීක්ෂා කරනු ලැබුවේද;

(v) එසේ නම්, එම කමිටුවේ නිර්දේශ අනුව සැපයුම්කරුවන් තෝරා ගනු ලැබුවේද;

(vi) දිවයින පුරා රජයේ පාසල්වල සෑම දරුවෙකුටම එක හා සමානව නිල ඇඳුම් රෙදි ලැබෙන්නේද යන්න පිළිබඳව පසු විපරම් කිරීමක් හෝ අවසන් වාර්තා සකස් කිරීමක් සිදුවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4762/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිරි ගම්මාන වැඩසටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ආරම්භ කර ඇති කිරි අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) දියර කිරි ප්‍රචලිත කිරීම සඳහා ආරම්භ කරන ලද ඉහත අලෙවිසැල් ක්‍රියාත්මක වීම පිළිබඳව පසු විපරම් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4816/'14

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපති ආරක්ෂක අංශය, අගමැති ආරක්ෂක අංශය සහ ප්‍රභූ ආරක්ෂක අංශය තුළ සේවය කරන නිලධාරීන් සඳහා යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලබන වයස් සීමාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වයස් සීමාවන් කවරේද;

(iii) ඉහත යෝග්‍යතා පරීක්ෂණ කාලය අතරතුර මරණයට පත් වූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) යෝග්‍යතා පරීක්ෂණ කාලය තුළදී, රෝගාතුර වූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4944/'14

ගරු තිස්ස අත්තනායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සම සෞඛ්‍ය හෙවත් හෙද සහ පරිපූරක වෛද්‍ය සේවා උපාධි පාඨමාලාව සඳහා නියමිත වූ කාල සීමාව කවරේද;

(ii) මේ වන විට එම උපාධි පාඨමාලාව හදාරනු ලබන මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම උපාධි පාඨමාලාව සඳහා වාර්ෂිකව ඇතුළත් කර ගනු ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් ලෙස සැලසුම් ඉදිරිපත් කොට විෂය නිර්දේශ සකස් කළ ඉහත සඳහන් උපාධි පාඨමාලාවේ කාල සීමාව මේ වන විට වසර තුනක් දක්වා අඩු කර තිබේද;

(ii) එසේ නම්, සිව් අවුරුදු පාඨමාලාවක් ලෙස විෂය නිර්දේශ සකස් කළ එම උපාධි පාඨමාලාව වසර තුනකින් නිම කිරීමට හැකියාවක් තිබේද;

(iii) එම උපාධි පාඨමාලාවේ අධ්‍යයන කාල සීමාව අඩු කිරීම හේතුවෙන් එම සිසුන්ට අසාධාරණයක් සිදු වන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4959/'14

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව බස් ඩිපෝව සඳහා අනුයුක්ත කර ඇති බස් රථ සංඛ්‍යාව;

(ii) මේ වන විට එම ඩිපෝව මගින් දෛනිකව ධාවනය කරවන බස් රථ සංඛ්‍යාව;

(iii) දැනට එම ඩිපෝවෙන් ධාවනයෙන් ඉවත් කර ඇති බස් රථ සංඛ්‍යාව;

(iv) එකී බස් ඩිපෝවේ සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව;

(v) ඔවුන්ගේ මාසික වැටුප් හා දීමනා ගෙවීම සඳහා අවශ්‍ය මුදල;

(vi) එම බස් ඩිපෝවේ මාසික ලාභය හෝ අලාභය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5031/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව තුළ සේවය කරනු ලබන පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එම දෙපාර්තමේන්තුව තුළ පශු වෛද්‍යවරුන් සඳහා පුරප්පාඩු පවතින්නේද;

(iii) එසේ නම්, එම පුරප්පාඩු කඩිනමින් පිරවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෙහිවල සත්වෝද්‍යානයේ රඳවා සිටින අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සතුන් අතරින් මේ වන විට ක්ෂය රෝගය වැළඳී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) එම රෝගී සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් දෙහිවල සත්වෝද්‍යානය තුළ තිබේද;

(iv) ක්ෂය රෝගය වැළඳී ඇති අලි ඇතුන් මගින් සත්වෝද්‍යානයේ සිටින අනෙකුත් සතුන් අතර එම රෝගය පැතිර යෑම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පින්නවල අලි අනාථාගාරයේ සිටින අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අලි ඇතුන් අතර ක්ෂය රෝගය වැළඳුන සතුන් සිටින බව වාර්තා වී තිබේද;

(iii) පින්නවල අලි ඇතුන් ක්ෂය රෝගයෙන් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5171/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ පළමුවැනි, දෙවැනි සහ තුන්වැනි වසර විභාගවලදී සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් පිළිතුරු සපයනු ලබන සිසුන්ට ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ප්‍රශ්න පත්‍ර ලබා දීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම තීරණයට හේතුව කවරේද;

(iii) එම තීරණයට අධිකරණ අමාත්‍යවරයාගේ එකඟතාව ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3317/'12

ගරු රවි කරුණානායක මහතා, — ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011.05.31 වැනි දින සිට මේ දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ 16 වැනි සහ 17 වැනි වගන්ති යටතේ අයෝජන ප්‍රවර්ධන මණ්ඩලය සමග ගිවිසුම්වලට එළඹ ඇති සමාගම් සංඛ්‍යාව සහ ඒ සඳහා ඉල්ලීම් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සංඛ්‍යාව වාර්ෂික සහ එක් එක් වගන්තිය පදනමින් කවරේද;

(ii) ඉහත අ(i) හි සඳහන් ව්‍යාපාර අතරින් මේ වන විට වාණිජ මෙහෙයුම් ආරම්භකර ඇති ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත අ(i) හි සඳහන් පරිදි සිදු කර ඇති ආයෝජනවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සමාගම්වලට ලබාදී ඇති බදු විරාම කවරේද;

(ii) 2010.01.01 දින සිට 2012.12.31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ ලියාපදිංචි වී ඇති සහ මෙහෙයුම් ආරම්භ කර ඇති සමාගම් සංඛ්‍යාව වාර්ෂික පදනමින් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතේ වගන්ති පදනමින් වෙන් වෙන්ව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

---

## 2014 ඔක්තෝබර් මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2678/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්‍රාම වැටුප් ගෙවීමේදී කිසියම් මාසයක 01 වැනි දිනෙක විශ්‍රාම ගිය අයෙකුට අදාළ මාසයේ විශ්‍රාමිකව සිටි දින ගණනට හෙවත් මුළු මාසයම සඳහා අඩු නොකළ විශ්‍රාම වැටුප ගෙවන අතර, 02 වැනි දිනක විශ්‍රාම ගිය අයට හුදෙක් ඊළඟ මාසයේ සිට පමණක් අඩු නොකළ විශ්‍රාම වැටුප ගෙවන බවත්;

(ii) මාසයේ මුල් දිනය නොවන දිනෙක විශ්‍රාම යන අයට එම තත්ත්වය බලවත් අසාධාරණයක් බවත්;

(iii) විශ්‍රාම වැටුප් ගණනය සිදු කළ යුත්තේ එවැනි අසාධාරණ ක්‍රමයකට බව විශ්‍රාම වැටුප් සංග්‍රහයේ කිසිදු වගන්තියක සඳහන් නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 31 වැනි වගන්තියෙන් පැවැරී ඇති බලය පාවිච්චි කර හෝ සුදුසු වෙනත් ආකාරයට අතීතයටත් බලපැවැත්වෙන සේ උක්ත අසාධාරණය ඉවත් කොට ඒ අනුව විශ්‍රාමිකයින්ට හිමිවිය යුතු හිඟ මුදල් ගෙවීමට කටයුතු කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3251/'12

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3824/'13

ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ශික්ෂණ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ සේවය කරන සනීපාරක්ෂක කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම රෝහල්වල සිටින රෝගීන් වෙනුවෙන් සනීපාරක්ෂක කම්කරුවන් ඉටුකරන කාර්යභාරය කවරේද;

(iv) එක් එක් ශික්ෂණ රෝහලේ සනීපාරක්ෂක කම්කරුවන් සඳහා දීමනා ඇතුළුව වැටුප් සඳහා ලබාදී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂයේදී එක් එක් ශික්ෂණ රෝහලේ සනීපාරක්ෂක කටයුතු සඳහා පුද්ගලික අංශයට ගෙවා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මුදල් ගෙවා ඇති පුද්ගලික ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3922/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර නගරය තුළ එක්රැස්වන කැළිකසළ මහනුවර, ගොහාගොඩ ප්‍රදේශයේ මහවැලි ගඟ ආසන්නයේ වූ ස්ථානයකට බැහැර කරන බවත්;

(ii) එම ස්ථානය අසල සත්ව ගොවිපළක් පවත්වාගෙන යනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ස්ථානයේ සත්ව ගොවිපළක් පවත්වාගෙනයෑම සඳහා නීත්‍යානුකූල අවසරයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලබා දී ඇති ආයතනයේ හෝ ආයතනවල නම් කවරේද;

(iii) එම සත්ව ගොවිපළෙහි හිමිකරුගේ නම සහ ලිපිනය කවරේද;

(iv) එකී සත්ව ගොවිපළේ හිමිකරු එම ව්‍යාපාරයට අමතරව වෙනත් ආයතනයක රැකියාවක් කරනු ලබන්නේ නම්, එම ආයතනයේ නම සහ ඔහු විසින් දරනු ලබන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4152/'13

ගරු අනුර දිසානායක මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 වර්ෂයේ ජගත් පරිසර දිනය වෙනුවෙන් වැයකරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් සපයා ගනු ලැබූ ආකාරය කවරේද;

(iii) අමාත්‍යාංශයේ අරමුදල්වලට අමතරව වෙනත් ආයතන වෙතින් ඒ සඳහා මුදල් සපයා ගැනීමක් සිදුකරනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ආයතන සහ ලබා ගන්නා ලද මුදල් ප්‍රමාණයන් කවරේද;

(v) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, රාජ්‍ය දැව සංස්ථාව, භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යන ආයතන වෙතින් ජගත් පරිසර දිනය වෙනුවෙන් රුපියල් ලක්ෂ 70 බැගින් ලබාගෙන තිබේද;

(vi) නොඑසේ නම්, එසේ මුදල් ලබා ගැනීමට අපේක්ෂා කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4295/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් ක්‍රීඩා තරගවලින් අවුරුදු 13න් පහළ වයස් කාණ්ඩයේ තරග ඉසව් ඉවත්කර තිබේද;

(ii) එසේ තරග ඉසව් ඉවත්කර ඇත්නම්, එය සිදුකළ දිනය කවරේද;

(iii) වයස අවුරුදු 13න් පහළ ක්‍රීඩා ඉසව් අහෝසිකර ඇත්නම්, තරග පැවැත්වෙන ඊළඟ වයස් කාණ්ඩය කවරේද;

(iv) ඒ අනුව වයස අවුරුදු 10 සිට අවුරුදු 12 දක්වා සිසුන් තරගවලට සහභාගිවීම සිදුනොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පාසල් දරුවන් ක්‍රීඩා තරගවල නියැලීමට පෙර විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තා පිරික්සා බැලීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මකවේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4433/'13

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ඉන්දීය ආරක්ෂක අමාත්‍යවරයා විසින් ලොක් සභාවේදී සිදුකර ඇති ප්‍රකාශයකට අනුව ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවෙන් අවි මිලදී ගැනීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම අවි ගනුදෙනුව සිදු කර ඇති දින වකවානු කවරේද;

(iii) ඉන්දියාව විසින් එසේ මිලදී ගනු ලැබ ඇති ආයුධ වර්ග කවරේද;

(iv) එම ආයුධ අලෙවි කිරීම මගින් ශ්‍රී ලංකාව ලැබූ ආදායම කොපමණද;

(v) එම ගනුදෙනුවල විනිවිදභාවය තහවුරු කෙරෙන වාර්තාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4614/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ වත්මන් ඒක පුද්ගල ආදායම සම්මත අයුරින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රටේ ආදායම් උපයනු ලබන පුද්ගලයින් අතර සිටින සමස්ත රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන් වත්මන් ඒක පුද්ගල ආදායමට සමාන හෝ එයට වැඩි වැටුප් ලබන රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එය සමස්ත රාජ්‍ය සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4758/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවූ දිනය කවරේද;

(ii) මේ වන විට හෝමියෝපති වෛද්‍ය සභාව ක්‍රියාත්මක වන්නේද;

(iii) 2012 වර්ෂය වන විට දිවයිනේ ලියාපදිංචි වී සිටි හෝමියෝපති වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(iv) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා අමාත්‍යාංශයෙන් යම් කිසි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4817/'14

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉදිවෙමින් පවතින දැදුරුඔය ජලාශ ව්‍යාපෘතියට සම්බන්ධ කර කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීමට යෝජිතව තිබේද;

(ii) එසේ නම්, ඒ තුළින් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරන විදුලි ධාරිතාව කොපමණද;

(iii) එකී ව්‍යාපෘතියට වැය වන මුළු මුදල කොපමණද;

(iv) මේ වන විට එම විදුලි ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබේද;

(v) එසේ නම්, ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන සමාගම කවරේද;

(vi) මෙලෙස නිපදවීමට අපේක්ෂිත විදුලි ධාරිතාව ලංකා විදුලිබල මණ්ඩලය විසින් මිලදී ගැනීමට ගිවිසුම් ගත වී තිබේද;

(vii) එසේ නම්, එක් විදුලි ඒකකයක් මිලදී ගැනීමට අපේක්ෂා කරන මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4855/'14

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ බෞද්ධ භික්ෂූන්වහන්සේලා පිළිබඳ සංඛ්‍යා ලේඛන බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය සතුව තිබේද;

(ii) ඒ අනුව අද වන විට ශ්‍රී ලංකාවේ වැඩ සිටින බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ සංඛ්‍යාව කොපමණද;

(iii) 2013 වර්ෂය තුළදී පැවිදි බව ලැබූ බෞද්ධ භික්ෂූන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වර්ෂය තුළ දී උපැවිදි වූ භික්ෂූන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනය රැක ගැනීම සඳහා විශාල මෙහෙයක් ඉටු කරන මහා සංඝ රත්නය ශාසනය හැරයාමේ හේතු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලාංකික භික්ෂුණී ශාසනය පිළිබඳව අමාත්‍යාංශය සතුව ඇති සංඛ්‍යා ලේඛනවලට අනුව අද වන විට ශ්‍රී ලංකාවේ වැඩ සිටින බෞද්ධ භික්ෂුණීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2013 වර්ෂය තුළ භික්ෂුණී ශාසනයට ඇතුළත් වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4907/'14

ගරු තිස්ස අත්තනායක මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහර බන්ධනාගාරය තුළ රඳවා සිටින මුළු රැඳවියන් සංඛ්‍යාව;

(ii) ඔවුන් අතරින් සැකකරුවන් ලෙස එහි රඳවා සිටින සංඛ්‍යාව;

(iii) සිරකරුවන් ලෙස රඳවා සිටින සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහර බන්ධනාගාරයේ "එල්" සහ "එන්" යන රැඳවුම් ශාලා දෙක සැකකරුවන් රඳවා තැබීමට යොදා ගන්නා බවත්;

(ii) එම ශාලාවල අධික තදබදයක් පවතින බවත්;

(iii) එහි වැසිකිළි පහසුකම් සහ බීමට හා නෑමට අවශ්‍ය ජල පහසුකම් අවම මට්ටමක පවතින බවත්;

(iv) ඉහත තත්ත්වයන් හේතුවෙන් එම ශාලාවල රැඳවියන් ඉතා පීඩාකාරී තත්ත්වයකට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මහර බන්ධනාගාරයේ රැඳවුම් ස්ථාන තුළ පවත්නා තදබදය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මහර බන්ධනාගාරයේ වත්මන් අධිකාරීවරයාගේ නම කවරේද;

(ii) එම බන්ධනාගාරය තුළ සේවය කරනු ලබන මුළු සේවක පිරිස කොපමණද;

(iii) මහර බන්ධනාගාරයේ අධිකාරීවරයා ඇතුළු සේවක පිරිස එහි රැඳවියන්ට අමානුෂික ආකාරයෙන් සලකන බවට වන චෝදනාවෙහි කිසියම් සත්‍යතාවයක් තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5024/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැයට කිරුළ 2014 යටතේ වයඹ විශ්වවිද්‍යාල භූමියේ, කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාල භූමියේ සහ කුලියාපිටිය කාර්මික විද්‍යාල භූමියේ සිදු කළ ගොඩනැගිලි ඉදිකිරීම් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් සිදු කරනු ලැබුවේද;

(ii) එම ඉදිකිරීම් වෙනත් සමාගම් විසින් සිදු කරනු ලැබුවේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(iii) එම එක් එක් ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එකී ගොඩනැගිලි ඉදිකරනු ලැබුවේ කොන්ත්‍රාත් පදනම මතද;

(v) එසේ නම්, ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබා දීමේදී අනුගමනය කරනු ලැබූ ටෙන්ඩර් පටිපාටි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5169/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බල ප්‍රදේශය තුළ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නමින් මාර්ගයක් නම් කර තිබුණේද;

(ii) එකී මාර්ගයේ නාම පුවරුව ඉවත් කර "එපිටමුල්ල පාර" ලෙස සඳහන් නාම පුවරුවක් 2014 වර්ෂයේ දී සවිකරනු ලැබ තිබේද;

(iii) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ජන්ම ශත සංවත්සරය යෙදී තිබුණු 2014 වර්ෂයේ දී එලෙස මාර්ගයේ නාමය වෙනස් කිරීමට පදනම් වූ හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5197/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ඇති මුදල් ශේෂය කොපමණද;

(ii) එම අරමුදලේ මුදල්, කොටස් වෙළඳපොළේ ආයෝජනය කර තිබේද;

(iii) එසේ නම්, එම අරමුදලින් කොටස් මිලදී ගෙන ඇති ආයතන කවරේද;

(iv) එම එක් එක් ආයතනයෙන් මිලදී ගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද

(v) 2013 වර්ෂය අවසානයේදී එම එක් එක් ආයෝජනයේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම අරමුදලේ මුදල් භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මිලදී ගැනීමට යොදවා තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා තැරැව්කරුවන්ගේ සහය ලබා ගෙන තිබේද;

(iii) එම තැරැව්කරුවන් කවුරුන්ද;

(iv) ඔවුන්ට කරන ලද ගෙවීම්වල වටිනාකම කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 20/'10

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

ගරු රවී කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ත වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබාදීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

ගරු රවී කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩපිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදිකිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යැයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවීව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

ගරු රවි කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය නිරතුරුව යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

ගරු රවි කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

ගරු රවි කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'10

ගරු රවි කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'10

ගරු රවි කරුණානායක මහතා, — ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'10

ගරු රවි කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/'10

ගරු රවි කරුණානායක මහතා,— මුළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම,— අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි හව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්,

නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩපිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සහා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු

පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඩුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩසටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු

පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'11

ගරු රවී කරුණානායක මහතා,— ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය නැවත නම් කිරීම,— නිදහස් අධ්‍යාපනයේ පියා වන දිවංගත ගරු (ආචාර්ය) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාට ගෞරවයක් වශයෙන් ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය එතුමාගේ නමින් නැවත නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/’11

ගරු රවී කරුණානායක මහතා,— මැතිවරණ ක්‍රියාවලිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම,— මැතිවරණ ක්‍රියා පටිපාටිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ස්ථිර පදනමකින් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/’11

ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදලින් සහ සේවක භාරකාර අරමුදලින් කඩිනමින් මුදල් ගෙවීම,— සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය දරන සියලුම සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල් ක්‍රියාකාරී සේවයෙන් විශ්‍රාම ගෙන එක් මසක් ගතවීමෙන් අනතුරුව ගෙවීම සඳහා විධිවිධාන සැළසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/’11

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය මාධ්‍යවල අපක්ෂපාතීත්වය තහවුරු කිරීම,— රාජ්‍ය මාධ්‍ය ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පමණක්ම හිමි වූ තනි අයිතිවාසිකමක්වන නිසාත්, රජයේ මාධ්‍ය නිරන්තරවම දේශපාලනීකරණයට ලක්වීමක් සිදුවී තිබෙන නිසාත් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී සිටින සියලුම දේශපාලන පක්ෂවලට රාජ්‍ය මාධ්‍ය තුළින් සමාන ලෙස සැලකීම සහ සමාන ලෙස අවස්ථාවන් ලබාදීම තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/’11

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය සේවයේ භාෂා ප්‍රවීණත්වයේ අවශ්‍යතාව,— වර්ෂ 2025 වන විට සියලුම රජයේ සේවකයන්ට සිංහළ, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම වැඩ කටයුතු කිරීමට, ලිපි හුවමාරු කර ගැනීමට සහ කථා කිරීමට හැකි වීම රජය විසින් අනිවාර්ය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/’11

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කරදීම,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා වෙත, දළ ජාතික නිෂ්පාදිතයෙන් 1% කට සමාන වූ විමධ්‍යගත අයවැය මුදලක් වාර්ෂිකව වෙන්කළ යුතු බවත් එම වෙන්කිරීමෙන්, 50% ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් උපයෝගීකර ගැනීමටත් ශේෂය රජයේ නිර්ණායක මත පදනම්ව තම ඡන්ද දායකයින් වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ අභිමතය පරිදි කවර හෝ පදනමකින් උපයෝගී කර ගැනීම සඳහාත් හිමිකම් ලබා දිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/’11

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක්

පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'11

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රට ඉඳි වගාව හඳුන්වාදීමේ හැකියාව විමසා බැලීම සඳහා පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම,— රට ඉඳි ශාකය (ෆීනික්ස් ඩැක්ටිලිෆෙරා) අප රටේ වගා කිරීම සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩිහි සිදු කරන ලද අත්හදා බැලීමක් සාර්ථක බව පෙනී ගොස් ඇති හෙයින්, අප රටේ ජනතාවට අපේම පොළවේ වවන ලද මෙම රසවත් පළතුර භුක්ති විඳීමට අවස්ථාව සලසනු පිණිස, රට ඉඳි වගාව හඳුන්වා දීමේ හැකියාව විමසා බලන පුළුල් අධ්‍යයනයක් සිදු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'11

ගරු රවී කරුණානායක මහතා,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීම,— ගුවන් විදුලි විකාශ නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.152/'11

ගරු රවී කරුණානායක මහතා,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීම,— රූපවාහිනී වැඩසටහන් විකාශය නියාමනය කිරීමේ ස්වාධීන අධිකාරියක් සංස්ථාගත කිරීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.153/'11

ගරු රවී කරුණානායක මහතා,— මහ නගර සභාවලට රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා හඳුන්වා දීම,— 2013 ජනවාරි මස 01 වැනි දින වන විට සෑම මහ නගර සභාවකම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා පිහිටුවීම සඳහා නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'11

ගරු රවී කරුණානායක මහතා,— හිමිකම් පනත සම්මත කිරීම,— මානව අභිමානය, සමානාත්මතාව සහ නිදහස යන ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් තහවුරු කරන දකුණු අප්‍රිකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම වන හිමිකම් පනත හා සමානව රටේ සියලු ජනතාවගේ හිමිකම් සහතික කරමින් එම පනතේ නිශ්චිතව දැක්වෙන සීමාවන්ට යටත්ව රාජ්‍යය විසින් ඒවා ගරු කළ යුතු, ආරක්ෂා කළ යුතු, ප්‍රවර්ධනය කළ යුතු හා ඉටුකර දිය යුතු බවට විධිවිධාන සලස්වන පනතක් ශ්‍රී ලංකාවේ සම්මත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'11

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශේෂ දීමනා ගෙවීම,— රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අනුමත කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවහොත් හැර කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට කිසිදු විශේෂ දීමනාවක් නොගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/'12

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ වරායන් සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාව භූගෝලීය වශයෙන් වාසිදායක ආකාරයට ස්ථානගත වූ කේන්ද්‍රස්ථානයක පිහිටා ඇති බවට ප්‍රචලිතව තිබීමත්, පුරාතනයේ සිටම නැව් ප්‍රවාහන සේවය ඉතා වැදගත් සේවා කර්මාන්තයක් වීමත් සහ ඉන්දියාව ඉතාම අධිෂ්ඨානශීලීව වරායන් සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීමෙහි නිරතව

සිටීමත් නිසා අප ඉන්දියාව සහ ඉන්දීය ව්‍යාපාර සමග එක් වී දෙරටේම යහපත පිණිස වරායන් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.161/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාඛවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාඛවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිඳු ධූරයක් නිස්සරණධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම

උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 164/'12

ගරු රවී කරුණානායක මහතා,— සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් බවට පරිවර්තනය කිරීම,— දේශපාලන මැදිහත්වීම් සහ දේශපාලන අනුග්‍රහයන්ට විශේෂයෙන් සම්බන්ධ සියලුම බාධකයන් ඉවත් වන පරිදි, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් බවට පරිවර්තනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 165/'12

ගරු රවී කරුණානායක මහතා,— තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම වෙනුවට "කලින් ඡන්ද ප්‍රකාශ කිරීම" හඳුන්වා දීම,— වත්මන් මැතිවරණ ක්‍රමය තුළ පවත්නා බොහෝ අඩුපාඩු මගහරවා වඩාත් සතුටුදායක තත්ත්වයකට පත්කිරීමට සහය වනු පිණිස, තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම වෙනුවට "කලින් ඡන්ද ප්‍රකාශ කිරීම" හඳුන්වාදීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 166/'12

ගරු රවී කරුණානායක මහතා,— විවෘත ඡන්ද හිමි නාම ලේඛනයක් හඳුන්වාදීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය වර්තමානයෙහි පවත්වාගෙන යන ස්ථාවර ආකාරයේ නාම ලේඛනයක් වෙනුවට විවෘත නාම ලේඛනයක් බවට පත් කරනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.170/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.171/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.172/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රීයව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.175/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.176/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි  මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.177/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25-30 ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.178/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව සෘජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.179/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මගින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.180/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව,

ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මගින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 186/'13

ගරු රවි කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්තිවල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම්වලට යොමු කෙරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.187/'13

ගරු රවි කරුණානායක මහතා,— අමාත්‍ය ආරක්ෂක අංශ නිලධාරීන් දේශපාලනඥයන්ට පමණක් සීමා කිරීම,— අමාත්‍ය ආරක්ෂක අංශය (MSD) මගින් සපයා දෙනු ලබන ආරක්ෂක නිලධාරීන් දේශපාලනඥයන්ට පමණක් සීමා කළ යුතු බවත් ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට ලබා නොදිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.188/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාව නගා සිටුවීම,— ඉහළ තලයේ කුසලතාවක්, කඩිසරභාවයක්, ශාරීරික යෝග්‍යතාවයක්, ක්ෂණික තීරණ ගැනීමක් සහ කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමක්, අවශ්‍ය කරන ප්‍රශස්ත ක්‍රීඩාවක් වන වොලිබෝල් ජාතික ක්‍රීඩාව නගා සිටුවීම සඳහා හොඳින් සැලසුම් කළ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.189/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— බීරළු නමින් හඳුන්වනු ලබන සම්ප්‍රදායික අත්යන්ත්‍ර රේන්ද කර්මාන්තය නගා සිටුවීම,— රේන්ද නිෂ්පාදනයේ නිරත ග්‍රාමීය ජනතාවට ඉහළ ආදායමක් ලබා ගැනීමට හැකියාව සලසා දීම සඳහා ඔවුන්ට නවීන පහසුකම් දෙමින් බීරළු ගෘහස්ත කර්මාන්තය වැඩි දියුණු කිරීමට සහ රේන්ද සහ රේන්ද නිෂ්පාදන සංචාරකයන් අතර ජනප්‍රිය කරවීමට ඵලදායී සහ අර්ථවත් පියවර ගත යුතුයැයි, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.190/'13

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික හේතූන් මත තරුණ මව්වරුන් ශ්‍රී ලංකාවෙන් පිටවී යාම වැළැක්වීමට නීති පැනවීම,— ශක්තිමත් සහ ප්‍රීතිමත් පවුල් පරිසරයක් ගොඩනැගීම සඳහා තරුණ මව්වරුන් විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබන හෙයින් ද, මෑත කාලයේදී එවැනි මව්වරුන් ශක්තිමත් පවුල් ඒකකයක පවතින සාරධර්ම විනාශකර දමමින් සහ බරපතල සමාජ අර්බුදයක් නිර්මාණය කරමින් විදේශ රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව ගිය හෙයින් ද, අවුරුදු පහට වඩා අඩු වයසැති දරුවන් සිටින මව්වරුන් ආර්ථික හේතූන් මත ශ්‍රී ලංකාවෙන් බැහැරවීම වැළැක්වීමට සුදුසු නීති පැනවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.191/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ පර්යේෂණ නිබන්ධන අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කර සකස් කිරීම,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් විසින් තම පාඨමාලා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධන රටේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සංවර්ධන කටයුතුවලට උපයෝගී කර ගැනීම වැදගත් වන බැවින් එම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන

ආචාර්යවරු හා පර්යේෂණ නිබන්ධන අදාළ වන අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා එකී අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කිරීමෙන් එම පර්යේෂණ නිබන්ධන මගින් අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සහ කාලීන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.192/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 18 සම්පූර්ණ වන අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම,— මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමට නියමිත දිනට පසුව හෝ පෙර දිනකදී වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ට නියමිත වයස සම්පූර්ණ වූ දිනටම ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කරවා ගත හැකි ආකාරයේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.193/'13

ගරු රවී කරුණානායක මහතා,— "ජාතික සෞඛ්‍ය සහා නිලතන්ත්‍රයක්" ඇති කිරීම,— සෞඛ්‍ය සේවාව කළමනාකරණය කිරීම කෙරෙහි අද පවතිනවාට වඩා ඉහළ මට්ටමේ පාලනයක් සහ අවධාරණයක් තිබිය යුතු හෙයින්, රේඛීය අමාත්‍යාංශයේ තිබෙන උපප්‍රශස්තිකරණය ඉවත්කර දැමීමට හා කපා හැරීමට උපකාරී වන සහ අග්‍රාමාත්‍යවරයාට වාර්තා කරන "ජාතික සෞඛ්‍ය සහා නිලතන්ත්‍රයක්" නිර්මාණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.195/'13

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම පාරිතෝෂිකය මත පනවා ඇති බදු නිදහස් කිරීම,— මෙරටෙහි පනවා ඇති බදු ඉතා අසමතුලිත තත්ත්වයක පවතින අතර වෙහෙසකර දිවියකින් අනතුරුව විශ්‍රාම ලබද්දී විශ්‍රාම පාරිතෝෂිකය ලබාගන්නා සේවකයන්ට 36% ක බදු ප්‍රමාණයක් ගෙවීමට සිදුවන බැවින්, විශේෂයෙන්ම ආන්තික ප්‍රතිලාභ සහ විශ්‍රාම පාරිතෝෂිකය මත පනවා ඇති බදු සම්පූර්ණයෙන්ම නිදහස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.196/'13

ගරු රවි කරුණානායක මහතා,— එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය අසුනක් ලබාගැනීම සඳහා ඉන්දියාවට සහාය වීම,— ඉන්දියාව ශ්‍රී ලංකාවේ සමීපතම මිතුරා වන බැවින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය අසුනක් ලබාගැනීම සඳහා ඉන්දියාවට සහාය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.197/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව සේලයින් විශාල ප්‍රමාණයක් භාවිතා කරනු ලබන අතර සේලයින් ආනයනය කිරීම සඳහා ද විශාල මුදලක් වාර්ෂිකව විදේශීය රටවලට ඇදී යන බැවින්, එම විදේශ විනිමය ප්‍රමාණය රට තුළ ඉතිරි කර ගැනීමේ අරමුණ ඇතිව ලංකාව තුළ පවත්නා දේශීය තාක්ෂණය යොදාගෙන සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හෝ සමුපකාර අංශයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය මැදිහත් වීමෙන් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.198/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව විශාල ප්‍රමාණයක පොල් වතුර අපතේ යන බැවින්, නව තාක්ෂණය යොදා ගනිමින් විධිමත් ක්‍රමවේදයක් යටතේ පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් දේශීය හා

ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.199/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අපනයන වෙළඳපොළ සඳහා දූරියන් වගා කිරීම,— මෙරටට සැලකිය යුතු විදේශ විනිමය ආදායමක් ඉපැයිය හැකි වන පරිද්දෙන්, මිල අධික නමුදු අපනයන වෙළඳපොළෙහි ඉහළ ඉල්ලුමක් සහිත ජනප්‍රිය පලතුරු වර්ගයක් වන දූරියන් වාණිජ මට්ටමෙන් වගා කරනු පිණිස පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.200/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ත්‍රි භාෂා ශ්‍රී ලංකාවක් සඳහා වූ දස අවුරුදු සැලැස්ම,— "ත්‍රි භාෂා ශ්‍රී ලංකාවක් සඳහා වූ 2012-2021 දස අවුරුදු සැලැස්ම" යන මැයෙන් වූ දස අවුරුදු සැලසුමට හිමිවූ අමාත්‍ය මණ්ඩල අනුමතියට ප්‍රසංශාව පළ කරන අතර, මෙම ව්‍යාපෘතිය සීග්‍රයෙන් හා දීප ව්‍යාප්තව බහු භාෂාවන් කථා කරන බහු වාර්ගික ජනතාවගේ පූර්ණ සහය ලබාගෙන, රාජ්‍ය සහ පුද්ගලික ආයතනවල සහයෝගයෙන් මුළු රටටම ප්‍රයෝජනවත් වන ආකාරයෙන් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.201/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සාගරයේ නව සම්පත් ගවේෂණය,— විශාල සාගර කලාපයක් හිමි රටක් වූ ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ ධීවර කර්මාන්තය සඳහා පමණක් වන අතර සාගරය ආශ්‍රිතව විශාල ප්‍රමාණයක සවභාවික සම්පත් ඇති බැවින් මෙරටට විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් මෙන්ම ධනයක් ද උපයා ගැනීමේ අරමුණ ඇතිව සාගර සම්පත් පිළිබඳව විධිමත් වැඩිදුර අධ්‍යයනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.202/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශිකයින් විසින් නෙලා ගැනීම වළකාලීම,— ශ්‍රී ලාංකික ධීවරයන්ට විශාල ආර්ථික අවාසියක් ඇති කරමින් ශ්‍රී ලංකා මුහුදු කලාපයේ මත්ස්‍ය සම්පත් විදේශිකයින් විසින් නෙලා ගන්නා බැවින් ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ මාළු ඇල්ලීමට සහ විදේශ යාත්‍රාවලට මාළු බෑම සඳහා තොටුපලක් ලෙස භාවිතා කිරීම වළකාලීම සඳහා රජය විසින් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.203/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— කොස් නිෂ්පාදනය වැඩි කර ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම,— ඉතා ප්‍රනීත මෙන්ම ඖෂධීය ගුණයෙන් අනූන, රසායනික ද්‍රව්‍යවලින් තොරව වගා කළ හැකි බෝගයක් වන කොස් වගාව ව්‍යාප්ත කිරීම තුළින් ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නංවා ඒවා අපනයනය කිරීම මගින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අප රටට උපයා ගත හැකි බැවින් ඒ සඳහා රජයේ මැදිහත්වීමෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.204/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ගොවි සම්මාන උළෙලක් වාර්ෂිකව සංවිධානය කිරීම, — රටක් පෙරට යාමට නම් මූලික වශයෙන් ගොවිතැනින් සශ්‍රික විය යුතු බැවින් රට සරු කරන ගොවි ජනතාවට සිය වෘත්තිය පිළිබඳ අභිමානයක් ඇතිවන පරිදි විධිමත් සංවිධාන ව්‍යුහයක් හරහා ක්‍රියාත්මක වන ගොවි සම්මාන උළෙලක් රජයේ මැදිහත්වීමෙන් වාර්ෂිකව සංවිධානය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.205/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සහන මිලකට LED බල්බ පාරිභෝගික ජනතාවට ලබාදීම, — නිවාස ආලෝක කිරීමට යොදා ගන්නා ගුණාත්මක LED බල්බ මිල අධික බැවින්, විදුලිබල මණ්ඩලය මැදිහත්වී සහනදායි මිලකට හා ගෙවීමේ ක්‍රමයට මෙම බල්බ පාරිභෝගික ජනතාවට ලබාදී ජාතික වශයෙන් විදුලිය විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමටත්, LED බල්බ ජනතාව අතර ජනප්‍රිය කිරීම මගින් විදුලිබල මණ්ඩලයටද අමතර ආදායමක් උපයා ගැනීමටත් හැකිවන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.206/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සුළු පරිමාණ සෙල්ලම් බඩු කර්මාන්තශාලා ව්‍යාප්ත කිරීම, — ශ්‍රී ලංකාව තුළ සෙල්ලම් බඩු සඳහා විශාල වෙළඳපොළක් පැවතුණ ද, රට තුළ ඒවා නිෂ්පාදනය කෙරෙන්නේ සුළු වශයෙන් වන අතර ඒ සඳහා චීනය ප්‍රමුඛ අනෙකුත් රටවලට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඇදී යන බැවින්, සුළු පිරිවැයක් දැරිය යුතු මෙම කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.208/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය දැනට ඉතා අවම මට්ටමක පවතින අතර ඖෂධ ආනයනය සඳහා වසරකට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවන බැවින් දියුණු මානව සම්පතක් හිමි රටක් ලෙස ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග රට තුළම නිපදවීමට අවශ්‍ය පහසුකම් රජය මැදිහත් වීමෙන් ලබා දී ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.209/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් විෂය නිර්දේශයට මනෝ විද්‍යාව විෂයය ඇතුළත් කිරීම,— පාසල් ශිෂ්‍ය ප්‍රජාව නිරෝගී මනසකින් යුත් බුද්ධිමත් තීරණ ගැනීමට හැකි පිරිසක් ලෙස හැඩගැස්වීම උදෙසා හය වැනි ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි බෞද්ධ මනෝ විද්‍යාව සහ බටහිර මනෝ විද්‍යාව යන විෂයයන් ඒකාබද්ධ කොට ක්‍රමවත්ව සැලසුම් කරන ලද "මනෝ විද්‍යාව සහ භාවනාව" නමින් විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.210/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවීම,— විශ්‍රාමිකයන් වෙනුවෙන් උපදේශන සේවා, වෛද්‍ය පහසුකම් සහ දිවා සුරැකුම් සේවා යනාදී වැඩිහිටියන්ට අවශ්‍ය සුබසාධන කටයුතු රැසක් එකම ස්ථානයකින් ඉටු කර ගැනීමට හැකි වන පරිදි විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන ගොඩනැංවීමටත්, එම මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් යම් නිෂ්පාදන කටයුත්තක් සඳහා විශ්‍රාමිකයන් යොමු කිරීම හරහා ඔවුන්ගේ දිවියට සහනයක් ලබාදෙන අතර අමතර ආදායමක් ද උපයා ගැනීමට හැකි වන ලෙස රජය මැදිහත් වීමෙන් රටපුරා විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.211/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමිකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නව ලොතරැයියක් හඳුන්වා දීම,— විශ්‍රාමික රාජ්‍ය සෙවකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට සහ ඔවුන්ගේ සුබසාධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා නව ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වාදීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.213/'14

ගරු රවි කරුණානායක මහතා,— ඉහළ තනතුරු දරන දූෂිත රජයේ නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— සිය ස්වාධීන තනතුරු වැරදි අරමුණු සඳහා යොදා ගන්නා සහ දේශපාලනීකරණය කරන රජයේ ඉහළ තනතුරු දරන නිලධාරීන්ට ඔවුන් වරදකරුවන් බව සනාථ වූ වහාම දඬුවම් පැමිණවීම සහ දඩයකට යටත් කිරීම සිදු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.214/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීම,— සංචාරකයින්ට ඵලදායී හා ආචාරශීලී සේවාවක් සැපයීමට හැකි පිරිසක් බවට පත් කිරීමට මෙන්ම, ඔවුන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම සඳහාත් සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.215/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් සම්බන්ධව පවතින නීති සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඉඩම්වලට ව්‍යාජ ඔප්පු සකසා විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මකවන අතර මීට අදාළව නීතිය ක්‍රියාත්මක වීම ද ඉතා අවම මට්ටමක පවතින බැවින්, ඉඩම් අයිතිය සම්බන්ධව සුරක්ෂිතභාවය වැඩි වන අයුරින් හා වැරදිකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය හැකි අයුරින් පවතින නීති පද්ධතිය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.216/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව අවට සාගරයේ කොරල්පර ආරක්ෂා කර ගැනීම,— ශ්‍රී ලංකාව අවට සාගරයේ ඇති කොරල්පර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශවීමේ තර්ජනයට මුහුණපා ඇති බැවින්, එම කොරල්පර ආරක්ෂාකර ගැනීම සඳහා මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීමට හැකිවන පරිදි පුද්ගල ආකල්පමය වෙනසක් මෙන්ම, නෛතික රාමුවේ වෙනසක් ඇති කිරීම සඳහා විද්වත් කමිටුවක් හරහා සුදුසු වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.217/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් වෑන් රථ සඳහා කාන්තාවන් සේවයට යෙදවීම,— පාසල් වෑන් රථ සේවයෙහි ගුණාත්මක බව වැඩි කිරීමටත්, එම වෑන් රථවල ගමන් කරන දරුවන්ගේ ආරක්ෂාව උදෙසාත් සියලුම පාසල් සේවා වෑන් රථවල සේවය සඳහා කාන්තාවන් යොදා ගැනීම අනිවාර්ය කිරීමට නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.218/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ මිල පහත හෙලීම,— ශ්‍රී ලංකාව තුළ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර ඖෂධීය නාමයෙන් බෙහෙත් අලෙවි කිරීම කඩිනමින් ආරම්භ කිරීම මගින් ඖෂධ මිල පහත හෙලීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.219/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය හරහා අලෙවි කරන ඖෂධ ඇතුළු ජාවාරම් මැඩපැවැත්වීම,— මේ වන විට අන්තර්ජාලය හරහා ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවන්‍ය නිෂ්පාදන විශාල ලෙස අලෙවි කෙරෙන අතර මෙම ජාවාරම් අප රටේ

ජනතාවගේ සෞඛ්‍යයට සහ යහපැවැත්මට විශාල තර්ජනයක් වන බැවින් ඒවා මැඩපැවැත්වීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.220/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා නොකර වගා කිරීම,— අධික විෂ සහිත කෘෂි රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ තහනම් කර පැරණි ක්‍රමයට පරිසර හිතකාමී වගා ක්‍රමයක් රටට හඳුන්වාදීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීමට කෘෂි විද්‍යාඥයන් හා පරිසරවේදීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඔවුන්ගෙන් ලබා ගන්නා නිර්දේශ තුළින් ජනතාවට වස විසෙන් තොර සෞඛ්‍යාරක්ෂිත ආහාර වේලක් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත්වීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.221/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙන් මුදවා ගැනීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ වැඩි ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇති බැවින් පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලින් මුදවාගැනීම සඳහා රජය මැදිහත්වී විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.222/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඵලදායිතා කමිටුවක් පත් කිරීම,— රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඵලදායිතා වැඩසටහන්හිදී තම ආයතන ඉතා ඉහළ ඵලදායිතා මට්ටමක් කරා මෙහෙයවූ ආයතන ප්‍රධානීන් හඳුනාගෙන ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ප්‍රයෝජනයට ගත හැකි වන ආකාරයෙන්, එම ආයතනවල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ක්‍රමවේද අනෙකුත් ආයතනවලට ගැලපෙන පරිදි ආදේශ කිරීමට හැකිවන පරිදි එම ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත ජාතික ඵලදායිතා කමිටුවක් පිහිටවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.223/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ අංශය දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා එම ක්ෂේත්‍රයේ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.224/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉංග්‍රීසීන් රාජද්‍රෝහීන් ලෙස නම් කළ ශ්‍රී ලාංකිකයින් ජාතික වීරයන් ලෙස නම් කිරීම,— වර්ෂ 1815 සිට 1948 නිදහස ලැබීම දක්වා වූ කාලය තුළ ඉංග්‍රීසීන්ට එරෙහිව රට ජාතිය වෙනුවෙන් දිවි නොතකා සටන් කළ ශ්‍රී ලාංකිකයින් රාජ ද්‍රෝහීන් ලෙස නම් කර ඇති අතර ඔවුන් සියලුදෙනාම විශේෂ ගැසට් පත්‍රයක් මගින් ජාතික වීරයන් ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.225/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිභෝජනයට නුසුදුසු ආහාර වෙළඳ පොළට ඒම වැළැක්වීමට කටයුතු කිරීම,— පරිභෝජනයට නුසුදුසු ආහාර නිෂ්පාදනය කරන, අලෙවි කරන හා ඊට අනුබල දෙන පුද්ගලයන් හා ආයතන වැටලීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විශේෂ වැටලීම් ඒකකයට පවතින ගැටලු නිරාකරණය කර අවශ්‍ය පහසුකම් නොඅඩුව ලබා දීමටත්, වැරදිකරුවන්ට උපරිම දඬුවම් ලබා දිය හැකි වන පරිදි පවතින නීති පද්ධතිය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.226/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— වස විස නැති ආහාර නිෂ්පාදනය දිරිමත් කිරීම,— ආහාර හා සම්බන්ධ නිෂ්පාදන කටයුතුවල දේශීයව නිරතව සිටින නිෂ්පාදකයින් ඉලක්ක කර ගනිමින් ගුණාත්මක බවින් ඉහළ, සෞඛ්‍යාරක්ෂිත ආහාර පාරිභෝගිකයන්ට ලබා දීම තුළින් රටට කළ හැකි සේවාව පිළිබඳව දැනුවත් කර, ආකල්පමය වෙනසක් ඇති කිරීමට හා එලෙස වස විසෙන් තොර ආහාර නිපදවන ව්‍යවසායකයින්ට ගෞරව නාමයක් සහිත සම්මාන ප්‍රදානය කොට ඔවුන් දිරිගැන්වීමට වැඩසටහනක් රජය මැදිහත්වී ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.227/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අයථා ලෙස අත්පත් කරගත් අභයභූමිවලට අයත් ඉඩම් නිදහස් කරගැනීම,— ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කර ඇති අභයභූමිවලට අයත් ඉඩම් විවිධ පුද්ගලයින් හා සංවිධාන විසින් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන ඇති බැවින්, එම ඉඩම් නැවත ලබා ගැනීමට රජය කඩිනමින් මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.228/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ආදිවාසී ජනයා නගාසිටුවීම සඳහා සැලසුමක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට වාසය කරන ආදිවාසී ජනතාව පිළිබඳ වෙනම සංගණනයක් සිදුකර, ඔවුනට ජීවත් වීම සඳහා දැනට පවතින අපහසුතා ක්‍රමවත්ව හඳුනාගෙන, ඔවුනට ගෞරවනීයව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය සාධනීය සැලසුමක් ආදිවාසී නායකයින් ද ඇතුළත්ව පත්කරන ලද විද්වත් මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.229/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි හානි වූ පුරාවස්තු සංරක්ෂණය කිරීම,— තිස් වසරක යුද්ධය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති පුරාවස්තු විශාල ලෙස විනාශ වූ අතර පවතින පුරාවස්තු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තොරතුරු රැස්කර ගැනීමත්, එම පුරාවස්තු තහවුරු කිරීම, ආරක්ෂා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමත් අරමුණු කර ගෙන විද්වත් පුරාවිද්‍යාඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.230/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— වගා කිරීම සඳහා දේශීය බීජ ප්‍රචලිත කිරීම,— කෘෂි රසායන භාවිතයෙන් තොරව දේශීය කාබනික පොහොර ආශ්‍රයෙන් වගා කළ හැකි දේශීය බීජ වර්ග හඳුනාගෙන එම බීජ කඩිනමින් රට පුරා ව්‍යාප්ත කර රසායනික වස විසෙන් තොර ආහාර ජනතාවට ලබා දීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණ, තාක්ෂණය හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.231/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ භාෂා අධ්‍යයනයට පහසුකම් සැපයීම,— පුද්ගල බුද්ධියේ පෘථුල බව තීරණය වීමට ඔහු සතු භාෂා ඥානය ප්‍රධාන සාධකයක් වන බැවින් ඉංග්‍රීසි භාෂාව හැරුණුකොට අනෙකුත් ප්‍රධාන විදේශ භාෂා හැදෑරීමට අවශ්‍ය පහසුකම් පුළුල් කර, සැලසුම් සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.232/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කරන මුදල් සීමා කිරීම,— ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන සියලු මැතිවරණයන්හිදී ඇතැම් අපේක්ෂකයන් අති

විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන අතර මුදල් වියදම් කළ නොහැකි, එහෙත් රටට වැඩක් කළ හැකි බුද්ධිමත් පිරිසකට ඉන් අවාසි සහගත තත්ත්වයක් ඇති වන බැවින් මැතිවරණ සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය සීමා කිරීමට හැකි වන ආකාරයේ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.233/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවෙන් රැගෙන ගිය පුරාවස්තු නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති සමයේ අප රටින් පෘතුගාලය, ඕලන්දය හා මහා බ්‍රිතාන්‍යයට රැගෙන ගිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එම භාණ්ඩ නැවත අප රටට ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.234/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— සංඝාධිකරණයක් ස්ථාපනය කිරීම,— භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව හා ගෞරවය රැක ගැනීම වෙනුවෙන් උන්වහන්සේලාට අදාළ අධිකරණමය කාර්යයන් සඳහා වෙනම සංඝාධිකරණයක් පිහිටුවිය යුතු බවටත් එම අධිකරණ තීන්දු සඳහා නීතිමය බලය ලබාගැනීමට හැකි වන අයුරින් මෙම සංඝාධිකරණය ස්ථාපනය කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.235/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කිරීම,— පාර්ලිමේන්තුව ඇතුළු ජනතා නියෝජිත ආයතන සඳහා උපදේශකත්වය හා මග පෙන්වීම ලබා දීමට හා අණපනත්වලට සංශෝධන ඉදිරිපත් කළ හැකි නෛතික බලය සහිත සංඝ සම්මුතියෙන් පත් කර ගත් රාජ්‍ය පරිපාලනය, නීතිය, විදේශ කටයුතු හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ හසල දැනුමක් සහ අත්දැකීම් සහිත විද්වත් සංඝයා වහන්සේලාගෙන් සමන්විත ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.236/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලංකාවේ පැවැති ජල තාක්ෂණය හා වැව් තාක්ෂණය නැවත පණගන්වා රැකගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීමට හා අධ්‍යාපන පාඨමාලා මගින් උක්ත විෂය ගැන දැනුමින් සන්නද්ධ කරන ලද පිරිසක් නිර්මාණය කිරීමට හැකියාව ඇතිවන පරිදි “වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනය” නමින් ආයතනයක් රජය මැදිහත්වීමෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.237/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාවංශය අධ්‍යයනය සඳහා ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ගමන් මග පෙන්වන මහාවංශය අධ්‍යයනය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් “මහාවංශ අධ්‍යයන පර්යේෂණ ජාතික ආයතනය” නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.238/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ විරෝධී ක්‍රියා නැවැත්වීම,— ධර්ම ග්‍රන්ථ හා ප්‍රකාශන අධ්‍යයනය කිරීමේ මනා දැනුමක් ඇති නෛතික බලයක් සහිත විද්වත් සංඝ මණ්ඩලයක් පිහිටුවීම මගින් යම් නිර්මාණයක් එළිදැක්වීමට පෙර එය එම මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සමාජගත කිරීමට නුසුදුසු නම්, සංශෝධන ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි යාන්ත්‍රණයක් සැකසීම මගින් බෞද්ධ විරෝධී ක්‍රියා හා ප්‍රකාශන රචනා වීම හා බුදු දහම සම්බන්ධ කරමින් සාවද්‍ය නිර්වචන ඉස්මතුවීම නැවැත්වීම සඳහා රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.239/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශ හිතෛෂී කලා නිර්මාණ ඇගයීම,— දේශානුරාගය හා ආත්මාභිමානය ඇතිවන පරිදි දේශීය හා සංස්කෘතික වටිනාකමින් අනූන කලාකෘති වාර්ෂිකව ඇගයීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.240/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය නැංවීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සෞඛ්‍ය සම්පන්න, නිරෝගී හා කායිකව ශක්තිමත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ අරමුණින් ඔවුන්ට තමා කැමති ක්‍රීඩාවකට යොමු වීමට සහ ප්‍රායෝගික විනය පුහුණුවකට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.241/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන, ඒ හා සබැඳි අනුෂංගික අංශයන් මෙන්ම, භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු ආදී කරුණු එක් රැස් කර විධිමත්ව පරිගණක ගත කර, නවීන තාක්ෂණික උපකරණ සහ ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් වලින් පිරිපුන් "බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.242/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— දහම් පාසල් පාඨ ග්‍රන්ථ කාලානුරූපීව සංශෝධනය කිරීම,— විභාග ඉලක්ක කරගත්, දැනුම පමණක් කේන්ද්‍රගත කළ පාඨ ග්‍රන්ථ වෙනුවට ප්‍රායෝගික පුහුණුව පදනම් කරගත්, බුද්ධිය වර්ධනය කරන්නාවූ, ශිෂ්ට සම්පන්න සමාජයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගත් පාඨ ග්‍රන්ථ විද්වත් මණ්ඩලයක් හරහා සම්පාදනය කර දහම් පාසල් වෙත ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.243/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාත්‍යන්තර පාසල් නියාමනයට මණ්ඩලයක් පත් කිරීම,— ශ්‍රී ලංකාවේ සංස්කෘතියට, සදාචාරයට හා සමාජ පැවැත්මට ගැලපෙන පරිදි ජාත්‍යන්තර පාසල්හි විෂය පථයන් අවශ්‍ය පරිදි නියාමනය කළ හැකි පූර්ණ බලතල සහිත මණ්ඩලයක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.244/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කිරීම,— දේශීය ඉතිහාස දැනුම, සාරධර්ම සම්පන්න බව, නිෂ්පාදන ශක්‍යතාව, බුද්ධි සම්පන්න බව, සම්ප්‍රදායික දැනුම, දේශානුරාගය, නිරෝගීතාව, කුසලතා පූර්ණ බව සහ ආකල්ප සම්පත්තියෙන් යුතු බව යන අංගයන්ගෙන් පරිපූර්ණ සාර්ථක පුරවැසියෙකු බිහි කල හැකි වන පරිදි සකසන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරහා සමස්ත අධ්‍යාපන ක්‍රමයේම පරිවර්තනයක් ඇති කිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.245/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම, — සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංශයක් වන පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රය තුළ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර ඒවා කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් එම පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීමට සැලසුම් කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.246/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සේවය විදේශයන්ට ලබා දීම,— ආයුර්වේද වෛද්‍ය උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්හට විදේශ රටවල රැකියා අවස්ථා ලබා දීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.247/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කිරීම,— දැනට පවතින යල් පැන ගිය ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කර ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වෘත්තීය ගැටලු විසඳමින්, එම වෘත්තිය සතු ගරුත්වය හා අභිමානය රැක ගැනීමට නව ආයුර්වේද වෛද්‍ය පනතක් කඩිනමින් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.248/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය ආරක්ෂක පද්ධති නිර්මාණය කළ නව නිපැයුම් කරුවන් ද, එම ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන් ද, දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන්ගෙන් ද සමන්විත කමිටුවක් මගින් දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.249/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම,— බස් මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම මගින් වාර්ෂිකව එම සේවාව ප්‍රතික්ෂේප කරන 1% - 2% ක් පමණ වූ මගීන් ප්‍රමාණය රඳවා ගැනීමට කටයුතු කිරීමෙන්, එම සේවයේ පැවැත්මට දීර්ඝ කාලීනව ඇති විය හැකි අවදානම අඩු කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.250/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— සිංහල භාෂාවට සම්මතයක් සකස් කිරීම,— සිංහල භාෂාවේ ලිඛිත ව්‍යවහාරය හා කථන ව්‍යවහාරය දෙයාකාරයක් ගන්නා අතරම න, ණ, ල, ළ භේදය, අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර යෙදීම සහ පද බෙදීම ආදිය ද විවාද සහිත බැවින් සිංහල භාෂාව සඳහා සම්මතයක් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර කාලානුරූපව සිදුවන වෙනස්කම් ද සැලකිල්ලට ගෙන භාෂාවේ පැවැත්ම තහවුරු කිරීමට හැකි ක්‍රියාදාමයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.251/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— සංස්ථානික කාබනික අපද්‍රව්‍ය මගින් පරිසරය දූෂණය වීම පාලනය කිරීම,— පළිබෝධ නාශක සහ කර්මාන්ත ක්‍රියාවලියන්හි දී පිටවන සංස්ථානික කාබනික අපද්‍රව්‍ය (Persistent Organic Pollutants - POPs) දොළොස් වර්ගයක දූෂණ කාරකයන්ගෙන් සමන්විත අතර ඒවා මිනිසාගේ සෞඛ්‍යයට ඉතා අහිතකර බැවින් එම රසායනිකයන් පරිසරයට මුදා හැරීම පාලනය කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.252/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පාලනයට සම්බුද්ධ දර්ශනය සම්බන්ධ කර ගැනීම,— සප්ත අපරිහානීය ධර්ම, දසරාජ ධර්ම, රාජෝවාද ජාතකය, කුරු ධර්ම ජාතකය, ගන්ඩ තින්දුක ජාතකය, තෙසකුර ජාතකය, දේවධර්ම ජාතකය, සතර සංග්‍රහ වස්තු, චක්කවත්ති සීහනාද සූත්‍රය හා ධර්ම ප්‍රදීපිකාව යන සම්බුද්ධ ඉගැන්වීම් සම්බන්ධව පාර්ලිමේන්තු, පළාත් සභා හා ප්‍රාදේශීය මට්ටමේ සිටින සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ භූමිකාව රටේ

යහපාලනයට දායක කර ගැනීමට හැකි වන ආකාරයේ වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.253/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම,— ෆ්ලොරසන්ට් බල්බ, දුරකථන, ජංගම දුරකථන, විදුලි උපකරණ, බැටරි, පරිගණක හා එහි කොටස් ආදිය අපද්‍රව්‍ය ලෙස පරිසරයට බැහැර කිරීමේදී ආසනික්, කැඩ්මියම්, රසදිය, ලෙඩ් වැනි බැර ලෝහ පරිසරයට එකතුවන බැවින් මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර පරිසරය සුරැකීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.254/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ යහපාලනය ස්ථාපිත කිරීම,— අයහපත් පාලනයේ අංග ලක්ෂණ වන අත්තනෝමතික ප්‍රතිපත්ති සම්පාදනය, නිලබල වාදය, බලාත්මක නොවන සහ අසාධාරණ නීති, විධායක බලතල අනිසි පරිහරණය, දේශපාලනයට පුරවැසි දායකත්වය අඩුවීම සහ දූෂණය පැතිරීම යන කරුණු අප රට තුළ නොඅඩුව දක්නට ලැබෙන අතර මේ නිසා රටේ අයහපත් පාලනයක් පවතින බව පෙනී යන හෙයින් රට තුළ යහපාලනය ගොඩනැඟීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.255/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රටවල ඇති ශ්‍රී ලංකාවට අයත් පුස්කොළ පොත් නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාවට අයත් වටිනා පුස්කොළ පොත් රාශියක් යුරෝපා රටවල් ඇතුළු ලෝකයේ රටවල් ගණනාවක තිබෙන අතර ඒවායේ අන්තර්ගතව ඇති දැනුම මේ වන විට වත්මන් ලාංකීය සමාජයට අහිමිව ගොස් ඇති බැවින්, එම පුස්කොළ පොත් අප රටට ආපසු ලබා ගෙන ඒවායේ අඩංගු පෞරාණික දැනුම නැවත සමාජගත කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.256/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ජෛව විවිධත්වය රැක ගැනීම සඳහා කෘෂිකර්මය දායක කර ගැනීම,— ඒක බෝග වගාව වෙනුවට බහු බෝග වගාව සහ මිශ්‍ර බෝග වගාව ජනප්‍රිය කරවීම, ජෛව විවිධත්වයට හානිකර රසායන ද්‍රව්‍ය කෘෂි කර්මාන්තයෙන් ඈත් කිරීම හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම භාවිතය තුළින් රට තුළ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට ගොවීන් යොමු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.257/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතාවගේ ආහාර ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීම,— එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව අයිතිවාසිකම් පද්ධතීන්ට අනුකූලව ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම ශ්‍රී ලාංකික ජනතාවට අහිමි වන තත්ත්වයක් රජයේ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම් තුළ දක්නට ලැබෙන හෙයින් උක්ත ප්‍රඥප්තීන්ට අනුව රටේ ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳීමේ වගකීම මුළුමනින්ම රජයට පැවරී ඇති බැවින් රජය මැදිහත්වී ආහාර ද්‍රව්‍ය මිල පාලනය හා සෞඛ්‍ය ආරක්ෂිත ආහාර වේලක් රටේ ජනතාවට ලැබීම සහතික කෙරෙන විධිමත් වැඩ පිළිවෙළක් සම්පාදනය කර ජනතාවගේ ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම තහවුරු කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.258/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම,— අකාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමත්, අකාබනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමත්, භාවිතයෙන් ඉවත්වන අකාබනික ද්‍රව්‍ය එකතු කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම හා අකාබනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ පරිසර

නීති රීති විධිමත් කිරීමත් තුළින් රටේ පරිසර පද්ධතියේ ආරක්ෂාව හා යහපැවැත්ම සඳහා අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.259/’14

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම,— නිරෝගී ජාතියක් ගොඩනැගීම සහ දේශීය ආයුර්වේදයේ යහපැවැත්ම මූලික අරමුණු වශයෙන් ගෙන දේශීය ඖෂධ වර්ග හා අත් බෙහෙත් පිළිබඳ විධිමත් කරුණු සහිත විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම මගින් දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 260/’14

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු කරු ජයසූරිය මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බෞද්ධ විහාර හා දේවාලගම් ආඥාපනතට යෝජිත සංශෝධන මගින් ඇති කරන බලපෑම පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

නීති කෙටුම්පත් සම්පාදක විසින් රජයේ උපදෙස් ප්‍රකාරව බෞද්ධ විහාර හා දේවාලගම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් (දැනට එල්. ඩී. ඕ. 20/2014 දරන) පිළියෙල කර ඇති හෙයින් ද;

දැනට පවතින බෞද්ධ විහාර හා දේවාලගම් ආඥාපනතට පුළුල් හා එලදායී සංශෝධන යෝජනා ලැබෙමින් පවතින හෙයින් ද;

මෙකී යෝජිත සංශෝධනවල විධිවිධාන සම්බන්ධයෙන් කිසිදු ප්‍රසිද්ධ සාකච්ඡාවක් සිදුව නොමැති හෙයින් ද;

මහා සංඝයාවහන්සේ සහ විහාර සතුව පවතින දේපළ ද ඇතුළත්වන්නා වූ බුද්ධශාසනය ආරක්ෂා කිරීමට සහ සුරක්ෂිත කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව රජය බැඳී ඇති හෙයින් සහ

විශේෂයෙන්ම මෙකී සංශෝධන මගින් වැඩි වශයෙන්ම බලපෑමට ලක්වන නිකාය කිහිපයෙහි මහා නායක හිමිවරුන් සහ බෞද්ධ භික්ෂූන්වහන්සේලා සමඟ කිසිදු සාකච්ඡාවක් සිදු කොට නොමැති හෙයින් ද;

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(අ) මහා සංඝයාවහන්සේ භාරයේ ඇති විහාර දේපළ සහ අනිකුත් දේවාලගම් සම්බන්ධයෙන් යෝජිත සංශෝධන මගින් ඇති කරන බලපෑම;

(ආ) විහාර දේපළ සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය බවට කාරක සභාවට හැඟෙන කිසියම් සංශෝධන;

(ඇ) මේ වනවිට මහා සංඝයාවහන්සේ භාරයේ පවතින විහාර දේපළ අයිතිකර ගැනීම හෝ බැහැර කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය කරනු ලබන පියවර;

(ඇ) විහාරස්ථාන සතු දේපළ හා මහා සංඝයාවහන්සේ සතු වෙනත් සාංඝික දේපළ පිළිබඳව යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර ඊට අදාළ මහානායක හිමිවරුන්ගේ උපදෙස් ගැනීමේ ක්‍රියාවලියක් අනුගමනය කිරීම සහතික කිරීම සඳහා යාන්ත්‍රණයක්;

(ඉ) අවස්ථානුකූලව, සුදුසුයැයි හා අවශ්‍යයැයි කාරක සභාවට හැඟෙන සහ කාරක සභාව විසින් සලකා බලනු ලබන කරුණට බලපාන වෙනත් යම් කරුණු.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කරනු ලැබිය යුතුය.

(ආ) ස්ථාවර නියෝග අංක 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුන ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ගෞරවනීය මහා නායක හිමිවරුන් විමසා ඔවුන්ගේ උපදෙස් මත කටයුතු කළ යුතු ය.

4. එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එම කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතුය.

5. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස හයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.